වාර්ෂික කාර්යසාධන වාර්තාව

ஆம் ஆண்டிற்கான செயற்சாதனை அறிக்கை - 2021

# Annual Performance Report








## கீடா සංවර්ධන දෙපාර්තමේන්තුව

## விளையாட்டு அபிவிருத்தித் திணைக்களம்

Department of Sports Development

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# 2021


**ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව**

**අංක 09 පිලිප් ගුණවර්ධන මාවත**

**කොළඹ 07**

**2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්යයසාධන වාර්තාව**

**ආයතනයේ නම :- ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව**

**වැය ශීර්ෂ අංකය :- 219**

## අන්තර්ගතය


**පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය**

**පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

**පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය**

**පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක**

**පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**

**පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ**

**පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව**

## පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1. හැදින්වීම

**ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව**

1960 දශකයේ දී කුඩා ඒකකයක් ලෙස ආරම්භ කරන ලද ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, 1970 දී අරඹන ලද පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතට ගෙන, 1996 දී ඒ ශ්‍රේණියේ දෙපාර්තමේතුවක් බවට උසස් විය.

නිරෝගිමත් ක්‍රියාශීලි සමාජයක් උදෙසා ක්‍රීඩා සංස්කෘතියක් සහ විනයගරුක බව තුළින් ක්‍රීඩාවේ විශිෂ්ඨයන් බිහි කරමින් ක්‍රීඩාවේ උන්නතිය සඳහා විශාල කාර්යභාරයක් ඉටු කරන ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව දැනට තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

### 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

ක්‍රීඩාවේ සංවර්ධනය තුළින් ආසියාවේ අභිමානවත් ජාතියක් බවට පත්වීම.


**මෙහෙවර**

ක්‍රීඩාවේ යටිතල පහසුකම් සහ මානව සම්පත් සංවර්ධනයට අදාල උපාය මාර්ගික මෙහෙයුම් ක්‍රියාවට නැගීම තුළින් ක්‍රීඩා සංස්කෘතියක් බිහිකිරීමත්, නිරෝගී, විනයගරුක ක්‍රීඩාවේ විශිෂ්ඨයන් බිහිකිරීම මගින් රටේ සංවර්ධනය ළඟා කර ගනිමින් ශ්‍රී ලංකාව ආසියාවේ අභිමානවත් ජාතිය බවට පත්කිරිම.

**අරමුණු**

01. සමාජයේ සියළුම අංශවලට ක්‍රීඩාවට අවකාශය ලබා දීම තුළින් ශාරීරික සුවතාවය, ඵලදායිතාවය හා තෘප්තිය වර්ධනය කිරීම.
02. ක්‍රීඩා ක්ෂේත්‍රය තුළින් ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ජයග්‍රහණ අත් කර ගැනීම.
03. ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාත්‍යන්තර තලයට ගෙන යා හැකි අන්තර්ජාතික මට්ටමේ දැනුමැති දේශීය පුහුණුකරුවන් බිහි කිරීම.
04. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතියෙන් යුත් ක්‍රීඩා පහසුකම් ලබා දීම.
05. ක්‍රීඩා සංගම් නියාමනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සහ ප්‍රමිතීන් ඇති කිරීම.

## 1.3. සංවිධාන සටහන


Department of Sports Development
Director General
1 1
SL 1
Director (Planning) 1 1
Director (Admin) 1 1
Chief Internal Auditor 1 1
Chief Accountant 1 1
Director (Sports) 1 0
Director (Engineer) 1 1
SL 1
Asst. Director (Admin) 1 1
Accountant 1 1
Accountant 1 0
Asst. Director (Sports) 1 1
Asst. Director (Sports) 1 1
Deputy Director (Sports) 1 1
Asst. Director (Sports) 1 1
Engineer 1 0
MN 7
Administrative Officer 1 1
Headquarters Sports Officer 20 11
MN 6
ICT Officer 1 1
Translator 1 1
MN 5
MN 4
D. O. * 
Planning & Programme Asst. *
D. O. *
Human Resource Development Asst. 1 0
D. O. *
D. O. *
D. O. *
Curator 4 0
D. O. (Virtual Incharge) 7 0
D. O. *
D. O. *
Planning & Programme Asst. *
MN 3
Sports Coach 103 92
Technical Officer 2 2
MT 2
Sport Officer 40 36
MT 1
Asst. ICT Officer
MN 2
M.S.O. *
M.S.O. *
M.S.O. *
M.S.O. *
M.S.O. *
M.S.O. *
M.S.O. *
MN 1
Warden 2 2
Asst. Warden 1 1
Ground Clerk 6 4
Exercise Assistant 10 0
PL 3
Driving Service 14 13
Driving Service 3 0
PL 2
Cook 1 0
PL 1
O.E.S. *
O.E.S. *
O.E.S. *
O.E.S. *
O.E.S. *
Asst. Cook 2 2
Ground Assistant 72 58
Life Guard 7 6
O.E.S. *
O.E.S. *
* D. O. 59 31
* M.S.O. 23 16
* O.E.S. 17 13
* Planning & Programme Asst. 2 0

### 1.4. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
- පාලන අංශය
- ගිණුම් අංශය
- සැලසුම් අංශය
- සංවර්ධන අංශය
- ක්‍රීඩා අංශය
- අභ්‍යන්තර විගණන අංශය
- ප්‍රසම්පාදන අංශය

### 1.5. දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතනගත අරමුදල්

රජයේ ඒකාබද්ධ අරමුදල්

### 1.6. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

අදාළ නොවේ

## 02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

**විශේෂ, ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක**

**2.1 ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතීන් හි ප්‍රගතිය**

| අනු අංකය | වැය ශීර්ෂය | විස්තරය | 2021 ප්‍රතිපාදන (රු.මිලි) | | | | 2021.12.31 දිනට මූල්‍ය වියදම (රු.මිලි.) | | | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | මූල් ප්‍රතිපාදන | ඉතුරුම් | මාරු කිරීම් | ශුද්ධ ප්‍රතිපාදන | ක්‍රී.සං.දෙ | දි.ලේ | එකතුව | | |
| 1 | 2506 | යටිතල පහසුකම් සංවර්ධනය | 250.000 | 0.000 | 0.000 | 250.000 | 181.525 | 3.679 | 185.204 | 74% | 90% |
| 2 | 17 – 2104 - 66 | දිස්ත්‍රික් හා පළාත් ක්‍රීඩා සංකීර්ණ ඉදි කිරීම. | 295.000 | 0.000 | 515.200 | 810.200 | 652.078 | 0.000 | 652.078 | 80% | 92.2% |
| | 46 | බාර්නාඩ් අළුවිහාරේ ක්‍රීඩාංගණය - මාතලේ | 100.000 | 60.000 | 0.000 | 40.000 | 0.000 | 0.000 | 0.000 | 0% | 40% |
| | 47 | වීරසිංහ මල්ලිමාරච්චි ක්‍රීඩාංගණය - කොළොන්නාව | 10.000 | 5.000 | 0.000 | 5.000 | 4.779 | 0.000 | 4.779 | 96% | 100% |
| 3 | 29 - 2104 | කල්මුණේ සන්දාංගනී ගෘහස්ථ ක්‍රීඩාගාරය වැඩිදියුණු කිරීම | 60.000 | 0.000 | 0.000 | 60.000 | 13.085 | 0.000 | 13.085 | 22% | 12% |

| අනු අංකය | වැය ශීර්ෂය | විස්තරය | 2021 ප්‍රතිපාදන (රු.මිලි) | | | | 2021.12.31 දිනට මූල්‍ය වියදම (රු.මිලි.) | | | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | මූල් ප්‍රතිපාදන | ඉතුරුම් | මාරු කිරීම් | ශුද්ධ ප්‍රතිපාදන | ක්‍රී.සං.දෙ | දි. ලේ | එකතුව | | |
| 4 | 2 – 1409 | **දක්ෂතා සංවර්ධනය** | | | | | | | | | |
| | 85. | ක්‍රීඩා සංගම් සඳහා දායකත්වය | 150.000 | 0.000 | 50.000 | 100.000 | 63.737 | 0.000 | 63.737 | 64% | 64% |
| | 86. | ක්‍රීඩා ශක්ති | 120.500 | 0.000 | (120.000) * | 0.500 | 0.039 | 0.414 | 0.453 | 90% | 0% |
| | 87. | ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා තරඟාවලි | 100.000 | 0.000 | 90.000 | 190.000 | 175.489 | 0.000 | 175.489 | 92% | 90% |
| | 89. | ජාතික මහා ක්‍රීඩා උළෙල | 212.900 | 0.000 | (200.000) * | 12.900 | 8.453 | 1.061 | 9.514 | 74% | 20% |
| | 95. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 332 සඳහා දායකත්වය | 15.430 | 0.000 | 0.000 | 15.430 | 0.000 | 4.755 | 4.755 | 31% | 20% |
| | 96. | සංචාරක ආකර්ෂණය සඳහා ක්‍රීඩා ඉසව් සංවිධානය | 10.000 | 0.000 | (8.000) * | 2.000 | 0.000 | 0.000 | 0.000 | 0% | 5% |
| | 97. | ක්‍රීඩා සැණකෙළිය | 100.000 | 0.000 | (97.200) * | 2.800 | 2.185 | 0.343 | 2.528 | 90% | 5% |
| | 98. | පුබුදුමු ක්‍රීඩා තරු | 10.000 | 0.000 | (10.000) * | 0.000 | 0.000 | 0.000 | 0.000 | 0% | 0% |
| | 100. | ශාරීරික යෝග්‍යතා සමාජ පිහිටුවීම | 10.000 | 0.000 | 0.000 | 10.000 | 0.145 | 2.201 | 2.346 | 23% | 35% |
| | 101. | ජයමහට පෙරමගක් | 100.000 | 0.000 | (100.000) * | 0.000 | 0.000 | 0.000 | 0.000 | 0% | 0% |

* රටේ පැවති කෝවිඩ් වසංගත තත්ත්වය නිසා සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව ඒකරාශීවීම් සිදු නොකරන ලෙස ලබාදුන් උපදෙස් මත කටයුතු කළ බැවින් ඇතැම් වැඩසටහන් ක්‍රියාත්මක නොකරන ලදී. ඒ අනුව එම වැඩසටහන්වලට වෙන්කළ ප්‍රතිපාදන, අවශ්‍යතාවය මත වෙනත් වැඩසටහන් වෙත මාරු කරන ලදී.

### 2.1.1. විශේෂ ජයග්‍රහණ

| අංකය (1) | ක්‍රීඩා තරඟාවලියේ නම (2) | පැවැත් වූ රට (3) | ක්‍රීඩාව (4) | බර පංතිය (5) | ඉසව්ව (6) | ක්‍රීඩකයාගේ නම (7) | දක්ෂතාව (රන්,රිදී, ලෝකඩ, ශූරතාව, අනු ශූරතාව (8) |
|---|---|---|---|---|---|---|---|
| 01. | පැරා ඔලිම්පික් ක්‍රීඩා උළෙල | ජපානය | මළල ක්‍රීඩා | - | හෙල්ල වීසිකිරීම | දිනේෂ් ප්‍රියන්ත | ලෝක වාර්තාව සමඟ රන් පදක්කම |
| 02. | | | | | | සමිත දුලාන් | ලෝකඩ පදක්කම |
| 03. | ආසියානු තරුණ පැරා ක්‍රීඩා උළෙල | බහරේන් | පිහිණුම් | - | - | එස්.එම්. බස්නායක | රන් සහ රිදී පදක්කම් |
| 04. | | | | | | එන්.ආර්. රහීම් | ලෝකඩ පදක්කම |
| 05. | | | මළල ක්‍රීඩා | - | | එම්.එස්.එම්. සප්රාන් | රන් සහ රිදී පදක්කම් |
| 06. | | | | | | ජේ.ආර්. ජයවර්ධන | රිදී පදක්කම |
| 07. | | | | | | ජේ.ඩී. වික්‍රමසිංහ | ලෝකඩ පදක්කම |
| 08. | පොදුරාජ්‍ය මණ්ඩලීය ජ්‍යෙෂ්ඨ සහ IWF තරඟාවලිය - 2021 | උස්බෙකිස්තානය | බර ඉසිලීම | කි. ග්‍රෑම්. 61 | පිරිමි | ඩී.කේ.ටී.එස්. පලන්ගස් | ලෝකඩ පදක්කම |
| 09. | | | | කි. ග්‍රෑම්. 73 | | ඩී.එම්.අයි. චතුර | ලෝකඩ පදක්කම |
| 10. | | | | කි. ග්‍රෑම්. 81 | | වී.සී.ජී. විදානගේ | ලෝකඩ පදක්කම |
| 11. | | | | කි. ග්‍රෑම්. 45 | කාන්තා | ඩී.එම්.එස්. සමාරකා | ලෝකඩ පදක්කම |
| 12. | | | | කි. ග්‍රෑම්. 59 | | ආර්.එම්.එන්.එස්. රාජපක්ෂ | ලෝකඩ පදක්කම |
| 13. | මධ්‍යම ආසියානු තරඟාවලිය | බංගලිදේශය | වොලිබෝල් | - | පිරිමි | කණ්ඩායම් තරඟ | රන් පදක්කම |
| 14. | යුනෙක්ස් - සන්රයිස් ජාත්‍යන්තර අභියෝග්‍යතාව 2021 සහ කණිෂ්ඨ ජාත්‍යන්තර තරඟාවලිය - 2021 | බංගලිදේශය | බැඩ්මින්ටන් | - | පිරිමි - යුගල | බුවනෙක ගුණතිලක සහ සචින් ඩයස් | රන් පදක්කම |
| 15. | | | | | මිශ්‍ර - යුගල | සචින් ඩයස් සහ කාවින්දි සිරිමාන්න | රන් පදක්කම |

| අංකය (1) | ක්‍රීඩා තරඟාවලියේ නම (2) | පැවැත් වූ රට (3) | ක්‍රීඩාව (4) | බර පංතිය (5) | ඉසව්ව (6) | ක්‍රීඩකයාගේ නම (7) | දක්ෂතාව (රන්,රිදී, ලෝකඩ, ශූරතාව, අනු ශූරතාව (8) |
|---|---|---|---|---|---|---|---|
| 16. | බහරේන් ජාත්‍යන්තර තරඟාවලිය | බහරේන් | බැඩ්මින්ටන් | - | පිරිමි - යුගල | බුවනෙක ගුණතිලක සහ සචින් ඩයස් | ලෝකඩ පදක්කම |
| 17. | ලෝක තරුණ වෙස් ශූරතාවලිය (මාර්ගගත ක්‍රමය ඔස්සේ) | - | වෙස් | - | වයස අවු. 10 න් පහළ | ඔෂිනි දේවින්ද්‍යා ගුණවර්ධන | රන් පදක්කම |
| 18. | බටහිර ආසියානු තරුණ වෙස් ශූරතාවලිය (මාර්ගගත ක්‍රමය ඔස්සේ) | - | වෙස් | - | අවු. 18 න් පහළ පිරිමි විවෘත | හර්ෂණ තිලකරත්න | රන් පදක්කම |
| 19. | | | | | | සුසිල් ද සිල්වා | රිදී පදක්කම |
| 20. | | | | | වයස අවුරුදු 12 න් පහළ කාන්තා | එසන්දි නවන්සා | ලෝකඩ පදක්කම |
| 21. | 58 වන ලෝක යුධ හමුදා බොක්සිං ශූරතාවලිය | රුසියාව | බොක්සිං | - | පිරිමි | සංජීව කුමාර | ලෝකඩ පදක්කම |
| 22. | | | | | කාන්තා | ගයනි කළුආරච්චි | ලෝකඩ පදක්කම |
| 23. | ආසියානු බොක්සිං ශූරතාවලිය | එක්සත් අරාබි එමීර් රාජ්‍ය | බොක්සිං | - | කාන්තා | නදීකා පුෂ්පකුමාරි | ලෝකඩ පදක්කම |
| 24. | ශ්‍රී ලංකාව සහ දකුණු අප්‍රිකාව ජාත්‍යන්තර ක්‍රිකට් තරඟාවලිය - 2021 | ශ්‍රී ලංකාව | ක්‍රිකට් | - | - | - | ශූරතාව දිනා ගැනීම |

## 2.1.2 ඉදිරි ඉලක්ක

I. 2024, 2028, සහ 2032 ඔලිම්පික් සහ ජාත්‍යන්තර තරඟාවලින්හි පදක්කම් ඉලක්ක කරගෙන දිස්ත්‍රික් , පළාත් සහ ජාතික මට්ටමින් සහජ දක්ෂතා සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනාගැනීම සඳහා නව මුහුණුවරකින් පහත පරිදි දක්ෂතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(අ). ක්‍රීඩා ශක්ති වැඩසටහන යටතේ උසස් දක්ෂතා සංවර්ධන වැඩ සටහන
(ආ). ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 332 සඳහා දායකත්වය වැඩසටහන වෙනුවට ගමෙන් රටට ක්‍රීඩකයෙක් වැඩසටහන ක්‍රියාත්මක කිරීම
(ඇ). ජයමහට පෙරමහක් වැඩසටහන වෙනුවට ඔලිම්පික් සඳහා මාවත වැඩසටහන ක්‍රියාත්මක කිරීම

II. රටේ ජාතික ආර්ථිකයට සවියක් වීම පිණිස ක්‍රීඩා ආර්ථිකය ඉහළ නැංවීමේ අරමුණින් සංචාරක ආකර්ෂණය සඳහා ක්‍රීඩා ඉසව් සහ මෙගා ක්‍රීඩා ඉසව් සංවිධානය කිරීම හා විදේශ රැකියා වෙළඳපොල ඉලක්ක කරගෙන ජීවිතාරක්ෂක නිලධාරීන් 1000 ක් පුහුණු කර රැකියා සඳහා යොමු කිරීම.

III. සෞඛ්‍ය සම්පන්න නිරෝගී ජන සමාජයක් ඇතිකිරීම අරමුණු කොටගෙන ශරීර සුවතා සමාජ පිහිටුවීම සහ එළිමහන් ශරීර සුවතා වැඩසටහන් 125 ක් ඇති කිරීම.

IV. ක්‍රීඩා සංගම් අධීක්ෂණය යටතේ දෙවන පෙල ජාතික පුහුණු සංචිත (T2) 18 ක් දක්ෂතා සංවර්ධනය සඳහා පවත්වාගෙන යාම. (මේ වනවිට ක්‍රීඩා සංගම් 13 ක් මෙම වැඩසටහන යටතේ ගිවිසුම්ගත වී ඇති අතර ප්‍රතිලාභී ක්‍රීඩක ක්‍රීඩිකාවන් ප්‍රමාණය 400 ක් පමණ වේ).

V. ඔලිම්පික්, පොදුරාජ්‍ය මණ්ඩලීය හා ආසියානු තරඟාවලි ඉලක්ක කරගෙන උසස් දක්ෂතා සංවර්ධන (T1) යටතේ සුපිරි දක්ෂතා දක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ ඔවුන්ගේ පුහුණුකරුවන් දිරි ගැන්වීම සඳහා මාසික දිරි දීමනාවක් ලබා දීම. (දැනට ක්‍රීඩක ක්‍රීඩිකාවන් 60 දෙනෙකු ද පුහුණුකරුවන් 32 දෙනෙකු ද ප්‍රතිලාභීන් ලෙස හඳුනාගෙන ඇත).

VI. ටොරින්ටන් ක්‍රීඩාංගනයේ ප්‍රේක්ෂකාගාරය හා Cross Fit Gym අංග සම්පූර්ණ ලෙස නිම කිරීම.

VII. බිංගිරිය පළාත් ක්‍රීඩා සංකීර්ණය, වවුනියාව, ගම්පහ ක්‍රීඩා සංකීර්ණවල පිහිණුම් තටාක හා ගම්පහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ ප්‍රේක්ෂකාගාරය හා මීටර් 400 ධාවන පථය නිම කිරීම.



අධ්‍යක්ෂ ජනරාල්

## 03. පරිච්ඡේදය
## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ-එල්

### 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| අයවැය 2021 රු. | | සටහන | කණ්ඩායම 2021 රු. | නැවත ගලපන ලද 2020 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසිඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම් මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 1,544,232,000 | 1,314,807,609 | ඒසිඒ-3 |
| - | තැන්පතු | | 81,891,580 | 44,100,635 | ඒසිඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 12,930,554 | 11,144,553 | ඒසිඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | | | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 1,639,054,134 | 1,370,052,797 | |
| | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් | | | | |
| - | නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 1,639,054,134 | 1,370,052,797 | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ) | | 105,175,795 | - | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් | | | | |
| | නොවන ලැබීම් ඉ = (ඇ)-(ආ) | | 1,533,878,339 | 1,370,052,797 | |
| | අඩු කළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | - | - | |
| 210,560,000 | වැටුප්, වෙතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 182,417,050 | 170,960,139 | |
| 548,949,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 436,548,782 | 409,138,958 | ඒසිඒ-2(ii) |
| 1,900,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 1,322,413 | 1,614,006 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | 1,700 | |
| 761,409,000 | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | 620,288,245 | 581,714,803 | |
| | මූලධන වියදම් | | | | |
| | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා | | | | |
| 58,500,000 | වැඩිදියුණු කිරීම් | 10 | 34,633,480 | 31,344,431 | |
| 1,007,200,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 676,949,937 | 473,898,844 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසිඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම් | 13 | - | - | |
| 1,550,000 | හැකියා වර්ධනය | 14 | 1,317,847 | 1,195,621 | |
| 252,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 187,203,948 | 285,762,267 | |
| 1,319,250,000 | මුළු මූලධන වියදම් (උ) | | 900,105,212 | 792,201,163 | |
| | තැන්පතු ගෙවීම් | | 30,774,057 | 83,468,652 | ඒසිඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 14,190,702 | 11,557,532 | ඒසිඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 44,964,759 | 95,026,184 | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 1,565,358,216 | 1,468,942,150 | |
| 2,080,659,000 | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | (31,479,877) | (98,889,353) | |
| | අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය | | (31,479,876) | (98,889,353) | ඒසිඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | - | - | ඒසිඒ-3 |
| | | | (31,479,876) | (98,889,353) | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

**2021 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | තක්ෂ 2021 රු. | 2020 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසිඒ-6 | 3,716,665,054 | 3,034,652,758 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසිඒ-5/5(ඒ) | 110,256,940 | 253,827,270 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසිඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **3,826,921,994** | **3,288,480,027** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (157,465,268) | (107,607,893) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 3,716,665,054 | 3,034,652,758 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසිඒ-5(බී)** | 69,349,972.19 | 214,180,450 |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසිඒ-4 | 198,372,237 | 147,254,713 |
| අග්‍රිම ශේෂය | ඒසිඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **3,826,921,994** | **3,288,480,027** |

පිටු අංක 07 සිට 45 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 46 සිට 60 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ |
| නම : | නම : | අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| තනුකුරාධ විජේකෝන් | තනතුර : | නම : |
| දිනය : 22/02/2022 | දිනය : 2022.02.21 | දිනය : 2022/02/18 |
| තරුණ සහ ක්‍රීඩා අමාත්‍යාංශය | අමල් එදිරිසූරිය | ඩබ්.එම්.ඩබ්.එස්.කේ. වන්නිනායක |
| ලේකම් | අධ්‍යක්ෂ ජනරාල් | ප්‍රධාන ගණකාධිකාරි |
| අංක 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07. | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව අංක : 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07. | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව කොළඹ - 07. |

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒඑසී-සී

**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | කණ්ඩායම | |
|---|---|---|
| | 2021 රු. | නැවත ගලපන ලද 2020 රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මූළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | 28,905,085 | 40,628,962 |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | - | - |
| අග්‍රිම ලැබීම් | 1,544,232,000 | 1,314,807,809 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 12,675,218 | 11,409,737 |
| තැන්පතු ලැබීම් | 81,891,581 | 44,100,635 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | 1,667,703,884 | 1,410,947,143 |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 607,385,055 | 532,034,545 |
| සහනාධාර සහ මාරුකිරීම් | - | - |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 19,585,198 | 27,863,779 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 105,175,795 | - |
| අත්තිකාරම් ගෙවීම් | 14,254,002 | 12,098,248 |
| තැන්පතු ගෙවීම් | 30,774,058 | 83,468,652 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | 777,174,108 | 655,465,224 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **890,529,776** | **755,481,919** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | 1,662,538 | 1,383,687 |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම් | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **1,662,538** | **1,383,687** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 892,192,315 | 756,865,605 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මූළු මුදල් ප්‍රවාහය (ඉ)** | 892,192,315 | 756,865,605 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(890,529,776)** | **(755,481,919)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මූළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මූළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

**3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්**

**3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය**

| ආදායම් ක්ෂේත්‍රය | ආදායම් ක්ෂේත්‍රයේ විස්තර | ආදායම් ඇස්තමේන්තුව (රු) | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 2003.09.00 | අනෙකුත් ලැබීම් | 18,000,000.000 | 18,000,000.000 | 20,784,221.17 | 115% |
| 2002.02.99 | පොළිය | 1,400,000.000 | 1,400,000.000 | 1,662,538.26 | 118% |
| 2004.01.01. | පොළිය | 6,000,000.000 | 6,000,000.000 | 7,831,636.01 | 130% |
| 2002.01.01 | ගොඩනැගිලි කුලී | 150,000.000 | 150,000.000 | 338,428.04 | 225% |

**3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය** **රු.000**

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තක්‍ෂ වියදම | උපයෝගී කරනු ලැබී ප්‍රතිපාදන,අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 1,653,480,000.000 | 761,409,000.000 | 620,510,444.930 | 81.50% |
| ප්‍රාග්ධන | 975,050,000.000 | 1,319,250,000.000 | 900,105,211.620 | 68.23% |

**3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන** **රු.000**

| අනු.අංකය | ප්‍රතිපාදනය ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තක්‍ෂ වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල% ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01 | රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | උපාධිධාරී අභ්‍යාසලාභී මාසික දීමනා | – | 1,020,000.000 | 1,016,636.060 | 99.67% |

| අනු.අංකය | ප්‍රතිපාදනය ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල% ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 02 | තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය | සිරිමාවෝ බණ්ඩාරනායක බාලිකා විද්‍යාලයේ ක්‍රීඩාපිටිය ඉදිකිරීම | 17,959,588.77 | 16,007,545.650 | 16,007,545.650 | 100% |
| 03 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | ණය වාරික විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීම | 822,485.000 | 822,485.000 | 822,485.000 | 100% |
| 04 | තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය | කොළඹ ආනන්ද විද්‍යාලයේ දුණු විදීමේ පිටිය ඉදිකිරීම | _ | 2,056,320.000 | 1,738,531.200 | 84.55% |

### 3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 2021.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු) | 2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු) | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | _ | 261,673,091.120 | _ | _ |
| 9152 | යන්ත්‍රෝපකරණ | _ | 236,922,204,.560 | _ | _ |
| 9153 | ඉඩම් | _ | - | _ | _ |
| 9160 | කෙරීගෙන යන වැඩ | _ | 3,218,069,752.400 | _ | _ |
| | | | | | |
| | | | | | |

## 3.9 විගණකාධිපතිවරයා වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. SYA/A/DSD/02/21/02 මෙහි අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022 මැයි 31 දින

අධ්‍යක්ෂ ජනරාල්
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

**ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තක්ත්වාගණනය කළ මතය**

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තක්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තක්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව

1.2.1 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශ |
|---|---|---|
| 1.6.5 (ඊ) | දෙපාර්තමේන්තුවට අයත් ස්ථාන 05 ක ක්‍රීඩාංගන සහ නේවාසිකාගාර ස්ථාපිත කර ඇති අතර මෙම වත්කම් ගිණුම් ගතකර නොතිබුණි. | මෙම වත්කම් අදාළ වත්ක ලේඛනයන්හි ගිණුම් ග කිරීමට ක්‍රියාකල යුතු වීම |
| 2.4 | වර්ෂ 2 ක් ඉක්ම වූ එකතුව රු.මිලියන 76 ක් වූ තැන්පතු 129 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම තැන්පතු සම්බන්ධයෙ මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රි කල යුතුවීම |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ඇස්තමේන්තු ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල දැක්වීම

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03/ හි 3.2 ඡේදයට අනුව වාර්තාකරන ආයතනයේ මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇති සංඛ්‍යා අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශවල දක්වා ඇති ආදායම් වියදම් සහ ප්‍රධාන ලෙජර් ශේෂයන් සමග එකඟ වන බවට සහතික විය යුතු බව දක්වා තිබුණි. නමුත් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයේ ACA2, ACA2(i), ACA2 (iii), ACA2(iv), ACA2(v) හා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය යන ආකෘති පත්‍රවල දක්වා ඇති වාර්ෂික අයවැය ප්‍රතිපාදන වටිනාකම රු.547,871,000 කින් භාණ්ඩාගාර වාර්තා අනුව නොසැසඳුණි. 2021 අගෝස්තු 30 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹී තීරණයක් අනුව කටයුතු කර අයවැය දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන නැවත භරවා යැවීම හේතුවෙන් මෙම විචලතාවන් ඇති වී ඇති බව මෙම නොසැසඳීම් වලට හේතූන් ලෙස ACA 2(111) ආකෘතියෙහි දක්වා තිබුණි. මෙම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන සඳහා වෙන් කර ඇති අයවැය ප්‍රතිපාදන වලින් ඉතිරිකිරීමට අපේක්ෂිත ප්‍රතිපාදන පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් 2021 සැප්තැම්බර් 15 හෝ එදිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන්ට හා රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්රුන්ට නියම කර තිබුණි. නමුත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙම අමාත්‍ය මණ්ඩල තීරණය පදනම්ව වාර්ෂික අයවැය ප්‍රතිපාදන වෙනස් කර දක්වා තිබුණි.

1.6.2 අග්‍රිම සැසඳුම් ප්‍රකාශය

2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 චක්‍රලේඛයේ 7.2 ඡේදයෙහි වාර්තාකරණ ආයතනය විසින් වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් එකතු කරනු ලබන ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුලත් නොකල යුතු අතර, එම ආදායම අග්‍රිම සැසඳුම් ප්‍රකාශය තුල ගැලපීම් කල යුතු බවත් ඉකුත් වර්ෂ සංසන්දනාත්මක සංඛ්‍යාද ඒ අනුව දැක්විය යුතු බවත් සඳහන් වේ. නමුත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එකතු කරන ලද ආදායම් ලෙස රු.30,567,623 ක් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණද ඉකුත් වර්ෂ සංසන්දනාත්මක සංඛ්‍යා තොරතුරු දක්වා නොතිබුණි.

1.6.3 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ සටහන 05,06.07,10 ,11,14,15 හි දක්වා තිබූ ප්‍රතිපාදනයන් හා ඉතිරිවීම් වලට අදාල සංඛ්‍යා භාණ්ඩාගාර වාර්තා සමග සැසඳීමේදී රු.547,871,000 ක වෙනස්කම් ඇති බව නිරීක්ෂණය විය.

1.6.4 ACA – 3 අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශය

(අ) අග්‍රිම ලැබීම් යටතේ වෙනත් මූලාශ්‍ර වලින් ලද ලැබීම් ලෙස මූල්‍ය ප්‍රකාශන අනුව රු.19,383,687 ක් දක්වා තිබූ නමුත් දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව එය රු.20,735,021 ක් විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව අග්‍රිම ලැබීම් එකතුව රු.1,563,618,687 ක් ලෙස දක්වා තිබූ නමුත්, භාණ්ඩාගාර වාර්තා SA-70 අනුව හා දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව එය රු.1,563,411,588 ක් විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශය අනුව වියදම් මඟින් අග්‍රිම පියවීම රු. 1,458,439,892 ලෙස දක්වා තිබූ නමුත්,භාණ්ඩාගාරය වාර්තා SA-70 අනුව එය රු.1,458,235,793 ක් විය.

(ඈ) මූල්‍ය ප්‍රකාශය අනුව වියදම් මඟින් හා මුදල් මඟින් අග්‍රිම පියවීමේ එකතුව රු.1,565,615,687ලෙස දක්වා තිබූ නමුත්, භාණ්ඩාගාර වාර්තා SA-70 අනුව හා දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව එය රු. 1,563,411,588 ක් විය.

1.6.5 මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය

1.6.5.1 මූල්‍ය නොවන වත්කම්

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ආරම්භක ශේෂය හා ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය අතර other structure යටතේ out door sports & recreation facilities රු .71,503,757 ක වෙනසක් පැවති අතර ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශවල සටහනක් මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) 2020 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය නොවන වත්කම් අයිතම 09 ක රු.38,412,822 ක ශේෂයන් නිවැරදි නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී එම අයිතමයන්ට අදාල ආරම්භක ශේෂයන්ට එකතුකිරීම් සිදු කර තිබුණි. මේ පිළිබඳව ද මූල්‍ය ප්‍රකාශනයෙ සටහනක් මගින් දක්වා නොතිබුණි.

(ඇ) එකක් රු.93,000 ක් වටිනා බර ඉසිලීමේ උපකරණ කට්ටල 86 ක් සඳහා වූ වටිනාකම රු. 8,006,600 ක් වූ වැරදි ගනුදෙනුවක් CIGAS වැඩසටහනට ඇතුළත්ව තිබීම නිවැරදි කිරීම සිදුකර තිබූ අතර එය ක්‍රීඩා උපකරණ අපහරණයක් ලෙස රු. 8,006,600 ක් වූ අගයකට මූල්‍ය ප්‍රකාශ වල දක්වා තිබුණි.මේ පිළිබඳ මූල්‍ය ප්‍රකාශන වල සටහනක් මගින් දක්වා නොතිබුණි.

(ඈ) 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල 2020 දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණ අගය රු. 3,034,652,758 ක් වූ අතර එය 2021 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ 2021 ජනවාරි 01 වන දිනට එකතු කරන බදු අගය ලද රු. 38,412,821 ක් සමග අගය රු. 3,057,429,262 ක් වූයෙන් රු. 22,776,504 ක වෙනසක් නිරීක්ෂණය විය.

මේ අනුව මූල්‍ය ප්‍රකාශ වාර්තා කිරීමේ පදනම යටතේ අංක 07 ලෙස 2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘති වල සිදු කරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාල ගැලපුම් සිදුකර ඇති බව දක්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඉ) වාහන අපහරණය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2020 සැප්තැම්බර් මස දෙපාර්තමේන්තුව විසින් අපහරණය කරන ලද වාහන 04 ක් පිළිබඳව 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අපහරණ වටිනාකම ලෙස රු.7,400,000 ක් දක්වා තිබුණි. පෙර වර්ෂයට අදාළව මෙම ගනුදෙනුව ආරම්භක ශේෂයෙන් අඩු කිරීමක් ලෙස දක්වා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ සටහනක් මඟින් හෝ විස්තර දක්වා නොතිබුණි.

(ii) අංක 54-5281 දරණ වාහනය වෙන්දේසි කරන ලද රු. 1,517,900 ක් වූ මුදල 2020 සැප්තැම්බර් 07 දින දෙපාර්තමේන්තුව වෙත ගෙවා ඇතත් රු. 1,291,000 ක් පමණක් 2020 සැප්තැම්බර් 09 වන දින බැංකුවේ තැන්පත් කර තිබුණි. මුදල් රෙගුලාසි 177(1) ප්‍රකාරව එකතු කරගන්නා රජයේ මුදල් දිනපතා ප්‍රේෂණය කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඊ) තක්සේරු කිරීම හා ගිණුම්ගත කිරීම (ඉඩම් හා ගොඩනැගිලි)

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් පහත සඳහන් ඉඩම් හා ගොඩනැගිලි 2021 දෙසැම්බර් 31 දින වන විට තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

1. අංක 33 ටොරින්ටන් පෙදෙස - කොළඹ 07
2. හොකී ක්‍රීඩා පිටිය 100/10 නිදහස් මාවත කොළඹ 07
3. හොකී ක්‍රීඩා පිටිය අසළ නේවාසිකාගාරය 100/08 නිදහස් මාවත කොළඹ 07
4. මාතර කොටවිල ක්‍රීඩාංගනය මාතර
5. පොළොන්නරුව ජාතික ක්‍රීඩා සංකීර්ණය

1.6.6 කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව 2021 ජනවාරි 01 දින අයවිය යුතු කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමේ රු. 214,180,450 ක් ශේෂය තුල වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වලට අදාළ රු.32,791,686 ක් වූ එකතු කිරීමේ බදු මුදල් ඇතුළත්ව තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට දක්වා ඇති රු.69,349,972 ක් වූ ශේෂය තුල අයකර ගැනීමට ඇති අත්තිකාරම් මුදල හා එම මුදලට අදාළ එකතු කළ අගය මත බදු මුදල් ඇතුලත්ව තිබුණි.

(ඇ) මන්නාරම ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමට අදාලව ලබාදී තිබූ රු.40,962,026 ක් වූ (බදු සහිත) වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල පිළිබඳව හා 2021 දෙසැම්බර් 31 දිනට එම අගයෙන් අයවීමට ඇති රු.14,277,972 ක් වූ (බදු රහිත) කුලී වැඩ අත්තිකාරම් ශේෂය මූල්‍ය ප්‍රකාශය තුල ගිණුම්ගත වී නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අය වැය ප්‍රතිපාදන උපයෝගී කරගෙන බැදීම් හා බැරකම් සඳහා එළඹීම

(අ) 2020 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශන වල වැය විෂයයන් 3 කට අදාළව ගෙවිය යුතු බැරකම් ලෙස දක්වා තිබුණු අගයට වඩා රු.44,946 ක් වැඩියෙන් ද තවත් වැය විෂයයන් 4 ක බැරකම් ලෙස දක්වා නොතිබුණු රු.11,137,547 ක්ද 2021 වසරේ අයවැය ප්‍රතිපාදන වලින් වැයකර තිබුණි.

(ආ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 01 ඡේදය පරිදි 2017 වර්ෂයේ සිට වාර්ෂික විසර්ජන පනත මගින් සලසා දෙනු ලබන ප්‍රතිපාදන ප්‍රශස්ත මට්ටමින් උපයෝජනය කිරීම හා අනුමත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැඳීම් හා බැරකම්වලට එළඹීම වැලැක්වීමට උපදෙස් ලබා දී තිබුණද, වැය විෂයයන් 02 ක 2021 දෙසැම්බර් 31 දිනට පෙන්වා ඇති බැරකම් ප්‍රමාණයට වඩා 2022 මාර්තු 17 දිනට බැරකම් නිදහස් කිරීම සඳහා රු.441,696 ක් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) දෙපාර්තමේන්තුවේ සංවර්ධන අංශයට ලැබී තිබූ රු. 996,659 ක් වටිනාකමැති බිල්පත් 03 ක් මූල්‍ය ප්‍රකාශන වාර්තාවන්හි හා භාණ්ඩාගාර SA-92 වාර්තාවන්හි ඇතුළත් කර නොතිබුණි.

2.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම

2021දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 4 දෙනෙකුගේ හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.386,175 ක් වූ අතර, වර්ෂ 5ට වැඩි රු.98,550 ක ණය ශේෂ අතර වර්ෂ 16 කට වඩා පැරණි රු.58,450 ක ණය ශේෂය මිය ගිය නිලධාරියෙකු වන අතර ණය ගොණුව ලේඛණාගාරයේ නොතිබීම හා සේවා කාලය අවුරුදු 05 සම්පූර්ණ නොවීම නිසා මරණ පාරිතෝෂිතයෙන් අයකර ගැනීමට ද නොහැකි වීම හේතුවෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි.

2.3 තැන්පතු

(අ) මුදල් රෙගුලාසි 570 අනුව ඉඩම් ඉල්ලීම් සඳහා තැන්පතු හැර ව්‍යාපෘති අරමුදල් තැන්පතු ව්‍යාපෘතිය සම්පූර්ණ කළ දින සිට වර්ෂ 02 ක් හා අනිකුත් සියලුම තැන්පතු තැන්පත් කළ දින සිට වර්ෂ 02 ක කාල පරිච්ඡේදය තුළ නිමිකම් නොපැවොත් ඒවා ඉකුත් වූ තැන්පතු ලෙස සලකනු ලබන අතර මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව ඉකුත් වූ තැන්පතු පිළිබඳව වර්ෂ අවසානයේ ලැයිස්තු පිළියෙල කර අවස්ථාවෝචිත පරිදි අදාළ ගිණුමට හෝ රජයේ ආදායමට බැර කළ යුතු වුවද, තැන්පත් ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට පැවති වර්ෂ 02 සිට 05 දක්වා හා වර්ෂ 5 ට වඩා පැරණි රු.76,261,339ක් වූ තැන්පතු 129 ක් සම්බන්ධයෙන් 2022 මැයි 25 දින වන විටද මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) රු. 1,277,020 ක් වටිනා කොන්ත්‍රාත් 05 කට අදාළ නඩත්තු කාල සීමාව ඉක්මවා තිබුණද අවසන් බිල්පත් ඉදිරිපත් වන තෙක් ඒකී රැඳවුම් මුදල් විගණන දින වන විටත් නිදහස් කර නොමැති බවද විගණනයේදී නිරීක්ෂණය විය.

2.4 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි වේ.

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි 139 | වවුවර්වලට ගෙවීම් කිරීමේදී ගණන් දීමේ නිලධාරීන් කටයුතු කළ යුතු ආකාරය හා වවුවර්වලට ගෙවන නිලධාරියාගේ වගකීම් අනුව කටයුතු නොකර දෙපාර්තමේන්තුව විසින් 2021 ටෝකියෝ ඔලිම්පික් ක්‍රීඩා උළෙල සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කළ ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා පුහුණුකරුවන් සඳහා දීමනා ලෙස රු.26,328,910 ක් ගෙවීම් සිදුකර තිබුණි. |

| | |
|---|---|
| (ආ) මුදල් රෙගුලාසි 141 (2) හා මුදල් රෙගුලාසි 386 (5) | චෙක්පත් මඟින් ගෙවීම් කරන කල්හි නිසියාකාරව බලය පවරා ඇති නිලධාරීන් දෙදෙනෙකු විසින් චෙක්පත අත්සන් කල යුතු දක්වා තිබුණද, එක් නිලධාරියෙකු පමණක් අත්සන් කර තිබීම හේතුවෙන් රු.2,105,146 හා රු.5,064,073 වටිනා චෙක්පත් දෙකක් අදාල බැංකු විසින් අගරු කර තිබුණි. |
| (ඇ) මුදල් රෙගුලාසි 260 | වවුචර්වල නම් සඳහන් කැනැත්තාට හෝ ඔවුන්ගේ නීත්‍යානුකූල නියෝජිතයන්ට පමණක් ගෙවීම් කළ යුතු වන අතර, වැරදි කැනැත්තන්ට මුදල් ගෙවීමක් නොසිදු වනු සඳහා සියලු ආරක්ෂා විධිවිධාන යොදාගත යුතු වුවද, ඔලිම්පික් උළෙලට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ස්විඩනයේ සිට සහභාගී වූ ක්‍රීඩිකාවකට ගෙවීමට තීරණය කරන ලද ඇමරිකානු ඩොලර් 1500 ක් සඳහා රු.3,043,350.00 ක් වූ චෙක්පතේ ආදායකයාගේ නම ලෙස ක්‍රීඩිකාවගේ නම ලියා තිබුණද පසුව එය වෙනස්කර එම ක්‍රීඩිකාවගේ එකඟතාවය ලබාගැනීමකින් තොරව එම මුදල හා එම ක්‍රීඩිකාවට ලබා දීමට තීරණය කරන ඇමරිකානු ඩොලර් 40 ක් වූ අනියම් දීමනාව වන රු. 81,156 ක් ශ්‍රී ලංකා අශ්වාරෝහක සංගමයට ලබා දී තිබුණ අතර එම මුදල ක්‍රීඩිකාවට ලබා දුන් බවට සනාථන දෙපාර්තමේන්තුව විසින් ලබාගෙන නොතිබුණි. |
| (ඇ) මුදල් රෙගුලාසි 880 හා 891 | රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව හා මුදල් රෙගුලාසි 880 හා 881 ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් 15 ක් අතුරින් 06 දෙනෙකු පමණක් ඇප තැන්පත් කර තිබුණි. |
| 2015 ජූලි 10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2015 හි 9 (ඇ) ඡේදය | සුන්බුන් ලෙස අපහරණය කිරීම සඳහා භාණ්ඩාගාර්ය ලබන වාහන අපහරණය කිරීමට මත්තෙන් එම වාහනවල ලියාපදිංචිය අවලංගු කිරීමට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් මඟින් කටයුතු කල යුතු වුවද 2020 දෙසැම්බර් 16 දින රු.1,435,000 ක මුදලකට අපහරණය කරන ලද NA-6531 දරන වාහනයේ ලියාපදිංචිය 2022 අප්‍රේල් 25 දිනටත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව නමට පවතින බව නිරීක්ෂණය විය. |

| | |
|---|---|
| 2018 ජනවාරි 24 දිනැති අංක 05/2018 (i) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කලමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය 6.5 ඡේදය | සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

(අ) කල්මුණේ සන්ධාංගනී ක්‍රීඩා සංකීර්ණයේ ගෘහස්ත ක්‍රීඩාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

කල්මුණේ සන්ධාංගනී ක්‍රීඩා සංකීර්ණයේ ගෘහස්ත ක්‍රීඩාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු.මිලියන 155 (එකතු කළ අගය මත බදු මුදල් රහිත) අගයකට 2019 ඔක්තෝම්බර් 31 වන දින ඉදිකිරීම් ආයතනයකට ප්‍රදානය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය 2020 නොවැම්බර් 14 දින වන විට නිමකල යුතුව පැවති අතර 2021 දෙසැම්බර් 31 දින වන විට මෙම කොන්ත්‍රාත්තුව සඳහා රු.මිලියන 45 ක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා විධිමත් ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබීම හේතුවෙන් මෙම ඉදිකිරීම් පරිශ්‍රයට වෙනත් ක්‍රීඩාපිටි ඇතුලත්වන බැවින් ප්‍රදේශයේ ක්‍රීඩා සමිති මඟින් බාධා ඇතිවීම හේතුවෙන් යාබද ඉඩමේ බිම් කොටසක් එකතු කර ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි.

මෙම ව්‍යාපෘතිය සඳහා රු.31,045,976 (බදු මුදල් රහිත) ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් 2020 ජූලි 10 හා 2020 දෙසැම්බර් 16 දිනවල ගෙවා තිබුණද ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර තිබුණේ 2021 මාර්තු 22 දිනය. ව්‍යාපෘති කාලය 2022 මැයි 15 දින දක්වා දීර්ඝ කර තිබුණු අතර ගෙවන ලද අත්තිකාරම් මුදලට සරිලන සේ වැඩ කොටස් ඉටුකර භාරදීමට කොන්ත්‍රාත්කරු අවබෝධතා ගිවිසුමකට අනුව එළඹ තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් තාවකාලිකව ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණ අතර මේ අනුව මෙම ව්‍යාපෘතිය ඉදිකිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම ප්‍රමාද වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) වයඹ පලාත් ක්‍රීඩා සංකීර්ණයේ (බිංගිරිය) පිහිනුම් තටාකය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

වයඹ පලාත් ක්‍රීඩා සංකීර්ණයේ (බිංගිරිය) පිහිනුම් තටාකය ඉදිකිරීමේ ව්‍යාපෘතිය එකතු කළ අගය මත රු.84,399,475 (බදු මුදල් රහිතව) අගයකට 2017 ජනවාරි 03 දින පුද්ගලික ඉදිකිරීම් සමාගමක් වෙත වසරක කාලයක් තුළ ඉදිකිරීම් අවසන් කිරීම සඳහා ව්‍යාපෘතිය ප්‍රදානය කර තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දින වන විට රු.83,275,817 ක් ගෙවා තිබුණි.

මෙහි වැඩ ආරම්භ කිරීම 2017 ජූනි 15 දින සිදුකර ඇති අතර 2017 මාර්තු 03 දින වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.16,879,895 ක් ගෙවා තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරු වෙත රු. 16,441,574 ක් ගෙවීමට පැවති අතර මෙම ව්‍යාපෘතියේ මිල විචලනයන් සියයට 10 ඉක්මවා ඇති බැවින් ඒ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර අනුමැතිය ලබා ගැනීමට 2022 මැයි 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් කාලය අවබෝධතා ගිවිසුමක් මගින් දීර්ඝ කර තිබුණද 2022 මැයි 31 දිනටත් මෙම පිහිණුම් තටාකයේ ඉදිකිරීම් අවසන් කර නොතිබුණු අතර ඒ සඳහා ප්‍රමාද ගාස්තුද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) **මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ ගෘහස්ථ ක්‍රීඩාගාරය හා ප්‍රේක්ෂකාගාරය ඉදි කිරීමේ ව්‍යාපෘතිය**

මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ ගෘහස්ථ ක්‍රීඩාගාරය හා ප්‍රේක්ෂකාගාරය ඉදි කිරීමේ ව්‍යාපෘතිය රු.107,459,940 (බදු මුදල් රහිත) 2015 අගොස්තු 03 වන දින ඉදිකිරීම් ආයතනයක් වෙත ලබා දී තිබුණි. කොන්ත්‍රාත් කාල සීමාව මාස 09 ක් වන අතර 2016 මැයි 03 වන විට අදාළ ඉදිකිරීම නිම කල යුතුව තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2021 දෙසැම්බර් මස 31 දිනට රු. 61,335,327 ක් ගෙවා තිබුණු අතර එදිනට භෞතික ප්‍රගතිය සියයට 47 ක් විය. මේ අනුව මෙම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම ප්‍රමාද වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) **මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ පිහිනුම් තටාකය හා ප්‍රේක්ෂකාගාරය ඉදි කිරීමේ ව්‍යාපෘතිය**

මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ පිහිනුම් තටාකය හා ප්‍රේක්ෂකාගාරයේ කොන්ත්‍රාත් වටිනාකම රු. 53,139,423 ක් වූ ඉදි කිරීමේ ව්‍යාපෘතිය පුද්ගලික ඉදිකිරීම් සමාගමක් වෙත 2015 අගෝස්තු 03 ලබා දී තිබුණි. කොන්ත්‍රාත් කාල සීමාව මාස 09 ක් වන අතර 2016 මැයි 03 වන විට ඉදිකිරීම අවසන් කළ යුතුව තිබුණි. මෙම ව්‍යාපෘතිය සිදුකරන භූමිය පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත භූමියක් වීම හේතුවෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඉදිකිරීම් කටයුතු අත්හිටුවීමට උපදෙස් දී තිබුණි. 2019 පෙබරවාරි 07 දින නැවත වැඩ ආරම්භ කිරීමට අවසර ලබාදී තිබුණද 2021 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 74 ක් වූ අතර මෙම ඉදිකිරීම උදෙසා 2021 වසර තුල රු. 30,463,886 ක් ගෙවා තිබුණි. නියමිත කාලය තුළ ඉදිකිරීම් සිදුනොකිරීම් හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ඉදිකිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම ප්‍රමාද වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ මීටර් 400 ධාවන පථය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ මීටර් 400 ධාවන පථය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ඉදිකිරීම් ආයතනයක් වෙත රු.81,877,205 වටිනාකමට 2015 අගෝස්තු 03 දින පිරිනමා තිබුණි. කොන්ත්‍රාත් කාලය මාස 09 ක් වන අතර ඒ අනුව 2016 මැයි 03 දින ඉදිකිරීම අවසන් කළ යුතුව තිබුණි. මෙම ව්‍යාපෘතිය සිදුකරන භූමිය පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත භූමියක් වීම හේතුවෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් 2018 ජනවාරි 24 දිනැති ලිපියක් මඟින් ඉදිකිරීම් කටයුතු අත්හිටුවීමට උපදෙස් දී තිබූ අතර නැවත වැඩ ආරම්භ කිරීමට 2019 පෙබරවාරි 07 දින අවසර ලබා දී තිබුණි. එම දිනයේ සිට වලංගු කාලය ඉක්මවා වසර 03 ක් ගතවී තිබුණද ඒ සඳහා ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. 2021 වසර තුළ රු. 23,234,115 ක් ඇතුලත්ව 2021 දෙසැම්බර් 31 දිනට රු.33,479,994 ක් ගෙවා තිබුණු අතර ඒ අනුව ගිවිසුම් මුදලෙන් සියයට 41 ක් ගෙවා ඇති අතර භෞතික ප්‍රගතිය සියයට 55 ක් විය. ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් ඉදිකිරීම් ප්‍රමාදවී තිබුණු අතර මේ හේතුවෙන් මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි වී තිබුණි.

3.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

2021 වර්ෂයේ යෝජිත හා පෙර වර්ෂවල සිට ඉදිරියට ගෙන ආ ව්‍යාපෘති 13 ක ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 1155 ක් වූ අතර 2021 දෙසැම්බර් 31 දිනට වියදම රු.මිලියන 325 ක් විය. ව්‍යාපෘති විවිධ හේතු මත නිම නොකර අත්හැර දමා තිබීම හේතුවෙන් මෙතෙක් වැයකර ඇති රු.මිලියන 324.53 ක මුදල නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

2021 වර්ෂයේ යෝජිත හා පෙර වර්ෂවල සිට ඉදිරියට ගෙන ආ ව්‍යාපෘති 24 ක ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 1314 ක් වූ අතර 2021 දෙසැම්බර් 31 දිනට වැයකර ඇති වියදම රු. මිලියන 900.75 ක් විය. විවිධ හේතූන් මත මෙම ව්‍යාපෘති නිම කිරීම ප්‍රමාද වී තිබූ අතර ව්‍යාපෘති 09 ක පමණක් වැඩ නිමකර දෙපාර්තමේන්තුව වෙත භාරගෙන තිබුණු අතර තවත් ව්‍යාපෘති 04 ක පමණක් වැඩ අවසන් කර තිබුණි. පවතින ආර්ථික අර්බුද හමුවේ ප්‍රතිපාදන සලසා ගැනීමේ දුෂ්කරතාවයක්ද පවතින හෙයින් මෙම ව්‍යාපෘති සඳහා මෙතෙක් වැයකර ඇති වියදමෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීම අපහසු වී තිබුණි.

3.4 අනුමැතිය නොලක් ගනුදෙනු

219-2-1409 (87) වැය විෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව රු.මිලියන 100 ක් වූ අතර මු.රෙ 66 මාරු කිරීම් යටතේ තවත් රු.මිලියන 90 ක් ලබා ගෙන තිබුණු අතර ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 190 ක් විය. මෙම වැය විෂය යටතේ රු.මිලියන 175.489 ක් වියදම් කර තිබුණු අතර මෙම වියදම් අතුරින් රු. 25,361,250 ක් 2021 වසරේ පැවැත්වූ ටෝකියෝ ඔලිම්පික් උළෙලට සහභාගි වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මුදල් තිලිණ ප්‍රදානය කිරීම වෙනුවෙන් වැයකර තිබුණි. මෙම ගෙවීම 2021 ජූලි13 දින සිදුකර තිබූ අතර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය 2021 ජූලි15 දින ලබාගෙන ඇතත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.5 අපේක්ෂිත ප්‍රතිලාභ (outcome) ලබා නොගැනීම

2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග 7 7 (xii) අනුව ජාතික ක්‍රීඩා සංගම් විසින් එළඹෙන වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර එකී ක්‍රියාකාරී සැලැස්ම පවත්නා වර්ෂය අවසන් වීමට මාස තුනකට පෙර අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2021 වර්ෂය සඳහා ජාතික ක්‍රීඩා සංගම්වල ක්‍රියාකාරී සැලසුම් ඉදිරිපත් කර තිබුණේ ක්‍රීඩා සංගම් 65 කින් ක්‍රීඩා සංගම් 19 ක් පමණි.

4. මානව සම්පත් කළමනාකරණය

2021 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03 ක් ද තෘතිය මට්ටමේ පුරප්පාඩු 12 ක්ද, ද්විතිය මට්ටමේ පුරප්පාඩු 59 ක්ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 18 ක්ද පැවතුණු අතර එය තුළ ඇතුළත් දෙපාර්තමේන්තුවේ සහ ක්‍රීඩා ක්ෂේත්‍රයේ කාර්ය සාධනය සඳහා බෙහෙවින් බලපාන්නු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03 ක් සහ ක්‍රීඩා කටයුතු සම්බන්ධ කාර්යමණ්ඩලයේ තනතුරු 7 කට අදාළ පුරප්පාඩු 52 ක් පැවති බව නිරීක්ෂණය විය.

ක්‍රීඩා සංගම් 70 කට ආසන්න සංඛ්‍යාවක හා ක්‍රීඩාපිටි ඇතුළු විවිධ ඉදිකිරීම් කටයුතු,ප්‍රසම්පාදන ඇතුළු කාර්යභාරයන්හි මෙන්ම ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ සඳහා ක්‍රීඩකයින් තේරීම් සම්බන්ධ ගැටළු, ජාතික හා අන්තර්ජාතික අවබෝධතා ගිවිසුම් සකස් කිරීම යනාදී කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා 2022 මැයි 31 දින වන විටත් නීති නිලධාරී තනතුරක් අනුමත කරවා ගැනීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

එච්.එම්.රණසිංහබණ්ඩා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

## 04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| අදාල වර්ෂය තුළ නිමකල ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රමාණය | – | – | 50% |
| අන්තර්ජාතික පදක්කම් ප්‍රමාණය | – | – | 65% |

## 05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යය සාධනය

### 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

| ඉලක්කය / අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50 % - 74% | 75% - 100% |
| දිලිදුකමින්, කුසගින්නෙන් හා ලෙඩරෝග වලින් තොර, අවශ්‍යතා සැපිරූ හා සියළු ජීවිත සමෘද්ධිමත් කිරීම. | ශාරීරික යෝග්‍යතා සමාජ ඇති කිරීම | මහජන ශාරීරික යෝග්‍යතාවය උදෙසා පැවැත් වූ වැඩසටහන් ප්‍රමාණය | 35% | – | – |
| මනුෂ්‍යයාගේ සමස්ත හැකියාව ළඟාකර ගැනීමට හා පොදු සශ්‍රීකත්වය ලබාගැනීම සඳහා දායකවීමට සමාන අවස්ථා ලබාදීම. | 2028 වන විට ප්‍රධාන ක්‍රීඩා 5කින් ඔලිම්පික් පාරිසාධන මට්ටම කරා ළඟාවීම හා ජයග්‍රහණයක් ලබා ගැනීම | හඳුනාගත් ක්‍රීඩා තරහාවලින්හි දී සහ ශූරතාවලදී දිනාගත් ජාත්‍යන්තර පදක්කම් ගණන | – | 65% | – |
| ළමුන් සඳහා ආයෝජනය කරන සෑම දරුවෙක්ටම ප්‍රචණ්ඩත්වයෙන් තොරව වැඩීමට අවස්ථාව සැලසීම. | ජාතික මට්ටමින් ක්‍රීඩා උළෙල පැවැත්වීම | ජාතික මහා ක්‍රීඩා උළෙල දී පිහිටු වන ලද ශ්‍රී ලංකා වාර්තා ගණන | – | – | – |
| | දැනට ක්‍රීඩා යටිතල පහසුකම් භාවිතා කරන සංඛ්‍යාව වාර්ෂිකව 20% කින් ඉහළ නැංවීම | ක්‍රීඩා යටිතල පහසුකම් භාවිතයට ගන්නා පුද්ගලයින් ප්‍රමාණය | 30% | – | – |
| | සියළුම ක්‍රීඩා සංගම් ගිණුම් වාර්තා ඉදිරිපත් කර නිලවරණ පවත්වා පනතට අනුගත කිරීම | ක්‍රීඩා පනතේ විධිවිධානයන්ට අනුගත වන ක්‍රීඩා සංගම් ප්‍රතිශතය | – | – | 85% |

| ඉලක්කය / අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50 % - 74% | 75% - 100% |
| | අන්තර්ජාතික පදක්කම් ලබා ගත හැකි ක්‍රීඩකයන්ගේ ප්‍රතිශතය 40%කින් ඉහළ නැංවීම | දෙපාර්තමේන්තු පුහුණුකරුවන් විසින් හඳුනා ගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කර අන්තර්ජාතික පදක්කම් ලබා ගැනීමට ඉදිරිපත් කළ හැකි ක්‍රීඩකයින්ගේ ප්‍රතිශතය | 20% | – | – |

### 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

2021 වර්ෂයේ වසංගත තත්වය නිසා සැලසුම් කළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම මත යම් පසුබෑමක් සිදුවුවත් ජාත්‍යන්තර මට්ටමේ ජයග්‍රහණ ලබා ගනිමින් තිරසර සංවර්ධන ඉලක්ක සැලකිය යුතු මට්ටමකින් සපුරා ගැනීමට හැකි විය.

## 06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / අතිරික්ත |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 11 | 04 |
| තෘතීයික මට්ටම | 23 | 11 | 12 |
| ද්විතික මට්ටම | 256 | 197 | 59 |
| ප්‍රාථමික මට්ටම | 109 | 91 | 18 |

### 06.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේ දැයි කෙටියෙන් සඳහන් කරන්න.

දැනට පුරප්පාඩුව පවතින තනතුරුවලට අදාල රාජකාරී සේවයේ නියුක්ත සේවක සංඛ්‍යාව අතර බෙදාදීම මගින් හා නිලධාරීන් අතිකාල සේවයේ යොදවා ගැනීම මගින් අදාල රාජකාරී ආවරණය කර ගන්නා අතර, මෙම පුරප්පාඩුව පවතින තනතුරු සම්පූර්ණ කර ගැනීම සඳහා නියමිත බඳවා ගැනීම් ක්‍රම අනුගමනය කරනු ලැබේ. එසේම ආයතනයේ කාර්ය සාධනය ඉහල නැංවීම සඳහා මෙම පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

## 06.3 මානව සම්පත් සංවර්ධනය

| ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ පුහුණු පාඨමාලා -2021 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අනු අංක | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව | සමස්ථ ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය (විදේශීය/ | නිමවුම/ලබාගත් දැනුම |
| | | | | දේශීය | විදේශීය | | |
| 1 | සහකාර අධ්‍යක්ෂ කාර්යක්ෂමතා කඩඉම් පෙරහුරු | 3 | දින 02 | - | - | දේශීය | අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත. |
| 2 | බොක්සිං පාඨමාලාව | 1 | මාස 06 | රු. 7000.00 | - | දේශීය | අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත. |
| 3 | මළල ක්‍රීඩා පාඨමාලාව | 5 | වසර 1 | රු. 195000.00 | - | දේශීය | අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත. |
| 4 | ක්‍රීඩා ආබාධ කළමනාකරණය | 6 | වසර 01 | රු. 103500.00 | - | දේශීය | අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත. |
| 5 | රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | 1 | වසර 02 | රු .166667.00 | - | දේශීය | අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත. |
| 6 | Olympic Solidarity Sports Administration | 1 | - | රු .20000.00 | - | දේශීය | අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත. |
| 7 | දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන - වයඹ | 10 | දින 2 | රු. 152400.00 | - | දේශීය | අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත. |

| දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ පුහුණු පාඨමාලා - 2021 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අනු අංක | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව | සමස්ථ ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමවුම/ලබාගත් දැනුම |
| | | | | දේශීය | විදේශීය | | |
| 1 | Bid Evaluation and Public Procurement | 1 | දින 02 | රු. 5000.00 | - | දේශීය | අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත. |
| 2 | Government Payroll System | 3 | දින3 | රු. 15000.00 | - | දේශීය | අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත. |
| 3 | Induction Training (DO) | 16 | දින3 | රු.168000.00 | - | දේශීය | අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත. |
| අනු | වැඩසටහනේ නම | පුහුණු කරන ලද | වැඩසටහනේ | සමස්ථ ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය | නිමවුම/ලබා |

| අංක | | සේවක සංඛ්‍යාව | කාලසීමාව | දේශීය | විදේශීය | (දේශීය/විදේශීය) | ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| **4** | Certificate Course in HRM | 3 | දින 5 | රු. 30000.00 | - | දේශීය | අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත. |
| **5** | Certificate Course in Public Procurement | 1 | දින 5 | රු. 10000.00 | - | දේශීය | අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත. |
| **6** | Diploma in Public Procurement | 5 | වසර 1 | රු. 500000.00 | - | දේශීය | අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත. |
| **7** | ක.සේ.නි.සේවයේ I පන්තියේ කාර්යක්ෂමතා කඩඉම් පාඨමාලාව | 2 | දින 10 | - | - | දේශීය | අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත. |

- ❖ ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.
  අදාළ පුහුණු පාඨමාලාවෙන් ලබාගත් දැනුම කාර්යාලයේ කටයුතු සඳහා කාර්යක්ෂම ලෙස යොදාගත හැකිවීම.

## 07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නැත | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නැත | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නැත | | |
| 1.6 | වෙනත් | අදාළ නැත | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| **අංකය** | **අදාළ කර ගත යුතු අවශ්‍යතාව** | **අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /** | **අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි** | **අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා** |

| | | අනුකූල නොවේ) | කිරීම. | කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත්කිරීම. | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (CA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම. (මුදේ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම. | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳව ආයතනය තුළ දැනුවත් කර තිබීම. | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම. | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා |
|---|---|---|---|---|

| | | අනුකූල නොවේ) | කිරීම. | කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම. | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1 – 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගනන පනතේ (40)4 උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1 – 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම. | අනුකූල වේ | | |
| **8** | **වත්කම් කලමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිලිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම. | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **අංකය** | **අදාළ කර ගත යුතු අවශ්‍යතාව** | **අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල** | **අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.** | **අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ** |

| | | නොවේ) | | ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ | | |
| 8.5 | ගර්බිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම. | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම. | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනයෙන් කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම. | අනුකූල වේ | | |
| **අංකය** | **අදාළ කර ගත යුතු අවශ්‍යතාව** | **අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල** | **අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.** | **අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ** |

| | | නොවේ) | | ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 12 | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම. | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු. රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.3 | මු. රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාල රෙගුලාසිවලට අනුකූලව,රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම. | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම.** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරීයෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධික්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම. | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල නොවේ | කාර්ය සාධන ගිවිසුම්ගත වීම සඳහා ක්‍රියා කරමින් පවතී | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම.** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ | | |

අවසානය